
# දූතයා

ආත්මික සඟරාව
68 වන කාණ්ඩය
2023 පළමුවන කලාපය



"ඔබගේ වාක්‍ය මාර්ගයෙහි
මාගේ පාද හැසිරෙව්ව මැනව;
කිසි අයුක්තකට මා කෙරෙහි
බලපවත්වන්නට ඉඩ නොදුන මැනවම."
ගීතාවලිය 119 : 133

ශ්‍රී ලංකා රෙපරමාදු සභාව මඟින් ප්‍රකාශිතයි

# පටුන

01 කතුවැකිය

02 වසර 380 ඉතිහාසයක් දිගහරින ලන්දේසි කිතුණු සභාව

03 මිතුරෙනි කොයිබද යන්නේ ?

04 යොවුන් පිටුව විලාසිතා මන බඳිනා විලාසිතා

05 ළමා පිටුව

06 මන්නා සපිරි ඇදහිල්ල කරා

07 කුරුස දේවස්ථානය යාපනය කොටුව

08 කුරුසිය දෙකට බෙදෙයි

09 උත්තරීතර තැනැන්වහන්සේගේ කටුක ජීවිත මඟ

10 සභා පුවත්

**සංස්කාරක**
ගරු චමින්ද රත්නායක සභාපාලක තුමා

**පරීක්ෂණක යතුරු ලියනය**
රෝහිනී පෙරේරා

**කවරය හා පිටු සැකසුම**
නීලංග අබේසේකර

**ප්‍රකාශනය**
ක්‍රිස්තියානි රෙපරමාදු සභාව
අංක 363, ගාලු පාර, කොළඹ 06.
දුරකථනය : 0112 360 861

නොමිලේ උගැන්වෙන තැපැල් මාර්ගික බයිබල් පාඨමාලාව සහ පොත්, සඟරා ලබා ගැනීමට විමසන්න.
සුබ අස්න බයිබල් විද්‍යාලය, අංක 363, ගාලු පාර, කොළඹ 06.

ඔබගේ නිර්මාණ ( කවි, ලිපි, රචනා හා සාක්ෂි ) දූතයා සඟරාවෙහි පළ කිරීම සඳහා එවන්න.
දූතයා කතෲ, අංක 363, ගාලු පාර, කොළඹ 06.

කතුවැකිය

# කැමැත්තට අකමැතිවන්න, අකමැත්තට කැමතිවන්න කැමතිද?

අප අනුගමනය කරන දෙවිදාණන් අපගේ මුළු ජීවිතය කෙරෙහි අවධානය යොමු කරන අතර අප වසර ගතකරන ආකාරයද බලා සිටින සේක. අප උන්වහන්සේට ගණන් දිය යුතුව ඇත. කිතුණු ජීවිතයේදී අප විසින් යම්යම් දේ බැහැර කළයුතු මෙන්ම එකතු කර ගත යුතු දේද ඇත. එසේනම් සාර්ථක වසරක් උදා කර ගැනීමට "අප විසින් බැහැර කළයුතු දේවල් මොනවාද? එකතු කරගත යුතු දේවල් මොනවාද?" යි කියා මදක් සිතන්න. (එය සටහන් කරගත හැකි නම් වඩාත් ප්‍රයෝජනවත් වේ.) එසේ කිරීමෙන් ජාතියක් ලෙස හා දේශයක් ලෙස සාර්ථකත්වය උරුම කරගත් රජතුමෙක් වෙත අපගේ අවධානය යොමු කරමු.

**"මෙසේ අබියා තමාගේ පියවරුන් සමග සැතපී දාවිත්ගේ නුවර තැන්පත් කරනු ලැබුවේය, ඔහුගේ පුත්‍රවූ ආසා ඔහු වෙනුවට රජ වුණේය. ඔහුගේ කාලයෙහී දස අවුරුද්දක් දේශය නිශ්චලව තිබුණාය. ආසා තමාගේ දෙවිවූ ස්වාමින් වහන්සේගේ ඇස් හමුයෙහි යහපත්ව හරිව තිබුණ දේ කළේය. මක්නිසාද ඔහු අන්‍ය පූජාසනද උස්තැන්ද පහකොට, රූපස්තම්භ බිඳ, අෂේරා කණු කපා දැමුවේය: තවද තමුන්ගේ පියවරුන්ගේ දෙවිවූ ස්වාමින් වහන්සේ සොයන්නටද ව්‍යවස්ථාවත් ආඥාවත් පවත්වන්නටද යුදාවරුන්ට අණ කළේය.** (2 ලේකම් 14 : 1 - 4)

ප්‍රථමයෙන් අප විසින් සැලකිලිමත් විය යුතු කරුණ නම් වසර සාර්ථක, සඵලවත් හා ජයග්‍රාහී වසරක් බවට පත් කර ගැනීමේ රහස මැජික් එකක් හෝ ආශ්චර්යමත් සිදුවීමකින් සිදු නොවන බවයි. එය දේව සැලැස්මකි. ක්‍රමවේදයකි. වැදගත්ම දෙය නම් අප අදහන්නාවූ දෙවිඳුන් නොවෙනස්වන්නාවූ දෙවිදාණන් නිසා අප වෙනස්වීමය. වෙනස්වීම අසීරු කාර්යයක් බව මතක තබා ගන්න. එමනිසා සඵලත්වයේ පියවර දෙකක් වෙත අවධානය යොමු කරමු.

### දෙවියන් වහන්සේ අකමැති දේ ඉවත් කරන්න (14:3)

ආසා රජකමට පත්ව ප්‍රථමයෙන්ම සිදු කළේ ඊශ්‍රායෙල් දේශය තුළ හා ජනතාව අතර තිබූ දෙවියන් වහන්සේ අකමැති, එතුමන්ට අගෞරවය ගෙන දෙන සියල්ල ඉවත් කිරීමයි. තම පිය රජු ආරම්භ කළ දේවල් ඉවත් කිරීම අසීරු කටයුත්තකි. එනමුත් ඔහු ස්වර්ගීය පියාණන් අකමැති, භූමික පියා කැමති දේ ඉවත් කළේය. ලැබුවාවූ වසරේ දෙවියන් වහන්සේ අකමැති, අප කැමති ඉවත් කළ යුතුව ඇති දේ මොනවාද? මෙය අපගේ කැමැත්ත මත සිදුවන ක්‍රියාවකි. අප අකමැති නම් මෙය කිරීමට නොහැක. මන්ද ගැලවීම දෙවියන් වහන්සේගේ කැමැත්තෙන්ද, කීකරුකම අපගේ කැමැත්තෙන්ද සිදුවන ක්‍රියාවකි. මදක් සිතන්න. ඔබ ඊට සූදානම්ද ?

### දෙවියන් වහන්සේ කැමති දේ කරන්න (14:2)


ආසා රජු දෙවිදාණන්ගේ ඇස් ඉදිරියෙහි හරිව තිබුණු දේ කරන්නටත්, දේව වචනයට අනුකූලව ජීවත්වන්නටත් විය. මනුෂ්‍යයන්ගේ ඇස් ඉදිරියෙහි හරිව පෙනෙන ජීවිතයක් ගතකිරීම පහසුය. එනමුත් දෙවිදාණන්ගේ ඇස් ඉදිරියෙහි හරිව ජීවත්වීම අභියෝගයකි. අප විසින් දෙවිඳුන් අකමැති දේ ඉවත් කිරීම පමණක් නොව කැමති දේ කිරීමටද අවශ්‍ය වේ. බොහෝ කිතුණුවන් දෙවියන් වහන්සේ අකමැති දේ නතර කළද උන්වහන්සේ කැමති දේ කරන්නට පටන් ගෙන නොමැත. එනම් තම පරණ ආගම, රූප, හඳහන් අත්හැරිය මුත් සබත පැවැත්වීම, යාච්ඤා කිරීම, බයිබලය කියවීම සහ දසයෙන් කොටස වෙන් කිරීම පටන් ගෙන නොමැත. එමනිසා ඔවුන් බයිබලීය සඵලත්වය උරුම කරගෙන නොමැත. මදක් සිතන්න. ඔබත් එවන් කිතුණුවෙක්ද?

ඊශ්‍රායෙල් ජනතාව දෙවියන් වහන්සේ අකමැති දේ ඉවත් කිරීමෙන් හා කැමති දේ කිරීමෙන් ජාතියක් ලෙස හා දේශයක් ලෙස සඵලත්වය උරුම කර ගත්හ. (14:7)

**දෙවියන්වහන්සේ අකමැති දේ ඉවත් කිරීම - කැමති දේ කිරීම = සඵලත්වය**
(14 : 3) (14 : 2) (14 : 7)

ආදර ජේසුනී, ඔබවහන්සේගේ කැමැත්ත කරන පිණිස මම මාගේ කැමැත්ත අත්හරිමි. ඔබවහන්සේ කැමති දේ කිරීමට මා පෙළඹුව මැනව. මාගේ කැමැත්ත අත්හැරීමට ශුද්ධාත්ම බලය, ශක්තිය මා හට දුන මැනව.

ආමෙන්.



ගරු චමින්ද රත්නායක සභාපාලක තුමා

### වසර 380 ඉතිහාසයක් දිගහරින ලන්දේසි කිතුණු සභාව හෙවත්

# ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි රෙපරමාදු සභාව

**අතීතයෙන් බිඳක්** :- 16 වන සියවස වන විට ඉන්දියන් සාගරය අවට මුහුදු ප්‍රදේශයන්වල සමුද්‍රීය සංචාරයන්හි යෙදුණු බටහිර ජාතීන් නැගෙනහිර ලෝකය කෙරෙහි විශේෂ අවධානයකින් පසුවූ බව වාර්තාවේ. එහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂ 1805 දී පෘතුගීසින් අහම්බෙන් ශ්‍රී ලංකාවට ඇතුල්ව එහි ස්වභාවික පිහිටීම හා ආකර්ශණය රමණීයත්වය බැඳි ශ්‍රී ලංකාවේ රජතුමා බැහැදැක මුහුදුබඩ පදිංචියට අවශ්‍යය පහසුකම් ලබා ගෙන ඇත.

අනතුරුව පෘතුගීසින්ගේ ග්‍රහණයට පත්වූ ප්‍රදේශවල පාලන කටයුතු තම යුධ බලය යොදා ගනිමින් ශ්‍රී ලංකා රජයට හා සාමාන්‍ය ජනජීවිත වලට බලපෑම් ඇති කිරීමේ හා මෙම විපතෙන් ශ්‍රී ලංකාව ගලවාගනු පිණිස එකල උඩරට පාලකයා වූ විමලධර්ම සූරිය රජතුමා කටයුතු කොට ඇත. සමුද්‍රීය බලය හෙවත් එකල නාවික බලය අතින් ප්‍රබල තත්වයක පත්වූ ලන්දේසීන්ගේ පිහිට පැතීමට රජතුමා තීරණය කළේය.

වර්ෂ 1602 මැයි 31 දින මඩකලපුව වරායට පැමිණි ලන්දේසීන් ලේ බ්‍රෙබිස් (Le Brebis) නම් නෞකාවේ කපිතාන්ව සිටි ජොරිස් ෆැන් පිල්බර්පින් අද්මිරාල්වරයාට මහනුවර තම රාජධානියට පැමිණෙන පිණිස රජතුමා කටයුතු කර, පෘතුගීසින්ව ශ්‍රී ලංකාවෙන් පලවා හැරීම සඳහා දෙපාර්ශවය අතර ගිවිසුමකට එළඹුණි.

මෙහි ප්‍රථිපලයක් ලෙස ඕලන්දයේ හොලන් ප්‍රදේශයේ පාලකයාවූ ඔරෙන්ජ් හී කුමාරයා සමඟ මිත්‍ර ගිවිසුමකට එළඹ පෘතුගීසින් පලවා හැරීමට ඔවුන්ගේ සහය ගෙන ඇත. ඔවුන් ශ්‍රී ලංකාවේ නැගෙනහිර පලාතට මායිම්ව පිහිටි ත්‍රිකුණාමලය, මඩකලපුව වරායන් පෘතුගීසීන්ගෙන් මුදවාගෙන ශ්‍රී ලංකා රාජ්‍ය වෙත භාර දුනී. මෙම භාරදුර කාර්‍යය ක්‍රියාවට නැංවීමේදී ශ්‍රී ලංකා රජය සුදු ජාතිකයන්ගේ බලය අතර ගිවිසුම් කිහිපයක් සිදුවී තිබුණු බව ඉතිහාසය පවසයි. එම ගිවිසුමෙන් සියළුම යුධ කටයුතු සඳහා කරන වියදම් පෙරලා ඕලන්දයට ගෙවීමට රජතුමා පොරොන්දු වීය. එහෙත් පෘතුගීසි ග්‍රහණයෙන් ගලවා ලක් රජයට නැවත භාර දීමේදී සිදු වූ අක්‍රමිකතාවයන් හේතුවෙන්, එහි ප්‍රථිපලයක් ලෙස වූයේ ලංදේසීන් ශ්‍රී ලංකාව අතහැර නොයෑමයි. "ඉඟුරු දී මිරිස් ගත්තා වාගේ" යන ප්‍රස්ථා පිරුළ ඇති වූයේ මෙහි ප්‍රතිඵලයක් ලෙසය.

**ලන්දේසි සභාව හා එහි ආරම්භය :**

වර්ෂ 1640 මාර්තු 13 දින විලියම් ජාකෝබර් අද්මිරාල් වරයාගේ නායකත්වය යටතේ ගාල්ල කොටුව හා වරාය සම්පූර්ණයෙන් පෘතුගීසි ග්‍රහණයෙන් නිදහස් කරගත් බව ඉතිහාසය පවසයි. එහෙත් ගාල්ල ස්වභාවික වරායකින් යුත් නිසා රමණීය ප්‍රදේශය අත්හැර නොයෑමට ලන්දේසීන් තීරණය කළහ.

වර්ෂ 1642 ඔක්තෝබර් 06 වන දින ප්‍රථම ප්‍රතිසංස්කරණ හෙවත් රෙපරමාදු නමස්කාර මෙහෙය ඕලන්දයේ උක්රෙටෙහී ගෞරවණීය අන්තෝනියස් නෝර්ස්හෝමියස් දේවගැති තුමා විසින් තම සේවාදායකයන් සඳහා පවත්වනු ලැබීය. පසුව රෙපරමාදු ඇදහිල්ල ශ්‍රී ලංකාවේ මුහුදුබඩ සියළුම ප්‍රදේශ කරා පැතිර ගිය බවත් වාර්ථා වේ. රෙපරමාදු ඇදහිල්ලේ කේන්ද්‍රීය ස්ථානය ශුද්ධවූ ලියවිල්ල හෙවත් ශුද්ධවූ බයිබලය වෙතට මිනිසා යොමු කරවීමයි. පැරණි ඉතිහාසයට අනුව ගාල්ල, මාතර, අම්බලන්ගොඩ, කළුතර, කොළඹ, මීගමුව, කල්පිටිය, මන්නාරම, යාපනය ආදී සියළු ප්‍රධාන නගරාශ්‍රිතව රෙපරමාදු සභාවන් මෙලෙස ව්‍යාප්ත විය.

ලන්දේසි දේවස්ථාන ආසන්නයේ පාසල් පද්ධති ආර්ම්භ කර දේව වචනයේ ආත්මික ප්‍රතිපත්ති වලට ජනයා හා ඔවුන්ගෙන් පැවත එන්නන් දැනුවත් කොට ඇත. විදේශීය පාලකයන් පිළිබඳව දේශීය ජනයා අකමැත්තෙන් පසුවූ අතර බොහෝ ගැටුම්ද ඇතිවී තිබෙන බවට වාර්ථා වේ.

ලන්දේසීන්ගෙන් ලත් වාසී ශ්‍රී ලංකා පරිපාලන සේවය, දියුණුකොට ලක්බිම කොටස් 3 කට බෙදා එනම් ගාල්ල, කොළඹ හා යාපනය ලෙස, ඔවුන් විසින් පාලනය කරණ ලදී. පාසැල් අධ්‍යාපන පද්ධතිය, ලන්දේසි ගෘහ නිර්මාණ ශිල්පය, ආරෝග්‍යය ශාලාවන්, වෙළඳ මධ්‍යස්ථාන හා වර්තමානයේද භාවිතා වන "ලන්දේසි රෝම" නීති පද්ධතිය ඔවුන් විසින් අපට දායාද කොට දුන් දේවල් වේ.

කෙසේ වුවද වර්ෂ 1795 දී බ්‍රිතාන්‍ය ජාතීන් විසින් මුළු ශ්‍රී ලංකාවම යටත්කර ගෙන තම පාලනය යටතට ගත්හ. පසුව 1948 පෙබරවාරි 04 දින ශ්‍රී ලංකාවට නිදහස ලැබිය. මෙලෙස පෘතුගීසී, ලන්දේසී හා ඉංග්‍රීසි ජාතීන් විසින් වසර 443 ක් පමණ අප රට පාලනය කර ඇත. මෙම වකවානුව තුළ යහපත් හා අයහපත් සිදුවීම් වලට ජනයා මුහුණ දුන් බව නොරහසක් වන අතර, දේශපාලනමය, සංස්කෘතිමය හා ආගමික විපර්යාස ගණනාවකටද රටක් ලෙස මුහුණදී තිබීමද අප සඳහන් කළ යුතුය.

**වර්තමාන සභාව :-**


පළමුකොට රෙපරමාදු සත්‍ය, ක්‍රිස්තියානි සභාව ලෙසත්, පසුව ඕලන්ද රෙපරමාදු සභාව ලෙසත් හඳුන්වා දීය. එහෙත් වර්ෂ 1992 දී ශ්‍රී ලංකාව තුළ රාජ්‍යය අනුග්‍රහය සමඟ සමරන ලද 350 වසරක සභා සංවත්සර දේව මෙහෙයේදී ගන්නා ලද යෝජනාවක ප්‍රතිඵලයක් ලෙස වර්තමානයේ "ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි රෙපරමාදු සභාව" ලෙස හැඳින්වීමට තීරණය කරන ලදී. එය වර්ෂ 2007 අංක 08 දරණ ලංකාවේ ඕලන්ද රෙපරමාදු පොදු නියෝජිත මණ්ඩලය (සංශෝධන) පනත මගින් මාර්තු මස 21 දින පාර්ලිමේන්තු විශේෂ පනතක් විසින් සංශෝධනය කොට ගැසට් කරන ලදී.

ක්‍රිස්තියානි නිකායක් ලෙස වර්ෂ 1927 විශේෂ පාර්ලිමේන්තු පනතකින් මෙයට පෙරද ප්‍රසිද්ධ කර ගැසට් කොට තිබේ. ශ්‍රී ලංකාව තුළ තම නමස්කාර මෙහෙය පැවැත්වීමට හා එහි වර්ධන කටයුතු සඳහා දූත මෙහෙවරයෙහි යෙදීමට මෙයින් සම්පූර්ණ අයිතිය සභාවට හිමි විය.

වර්තමානයේ ශ්‍රී ලංකාව පුරා රෙපරමාදු සභා ශාඛාවන් පවත්වාගෙන යනු ලබන අතර, පොදු ජනයා හට අවශ්‍ය ආත්මීක අධ්‍යාපනය, සුභසාධන හා අනෙකුත් අවශ්‍යතාවයන් සපුරා දෙමින් ජන ජීවිතය ගොඩනැගීමෙහි යෙදී සිටීම සතුටට කරුණක් ලෙස සඳහන් කරමු.

වසර 380 යනු දීර්ඝ ඉතිහාසයක් ශ්‍රී ලංකාවේ ප්‍රථම රෙපරමාදු සභාව ලෙස ආරම්භ කොට මෙතෙක් දුරට නොකඩවා පවත්වාගෙන යෑමට හැකියාව ලැබීම පිළිබඳව ජීවමාන දෙවි සමිඳාණන් හට පළමුකොට නමස්කාර පූර්වකව ස්තුතිය පුද කරමු. තවද සභාව ඉදිරියට ගෙන යෑම සඳහා දායකත්වය දුන් සියළුම ගරු දේවගැති තුමන් ඇතුළු කෘත්‍යාධී කාර්ය මණ්ඩලයටද ස්තුති කිරීමට අමතක නොකරමු. තවද වරින්වර සභාව කෙරෙහි දක්වන රාජ්‍යය අනුග්‍රහය ගැනද සතුටු වෙමු. ජේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පුනරාගමණය තෙක් සභාව ඉදිරියටම ගෙන යෑමට උන්වහන්සේගේ අනුග්‍රහය හා ආශිර්වාදය ලැබේවා යි යන්න ප්‍රාර්ථනා කරමු.

"ගසක් කපාදැමුවොත්, එය යළිත් ලියලා එහි රිකිලි හටගනු ඇතැයි බලාපොරොත්තුවක් ඇත."
(යෝබ් 14:7)



වර්තමාන මහනායක
ගරු එස්.ඊ. ජේබර් දේවගැති තුමා



# මිතුරෙනි කොයිබද යන්නේ ?

මනුෂ්‍යයන් අතර පවත්නා මිත්‍ර සම්බන්ධතා වලට අරුතක් ඇත්තා සේ ස්වභාවධර්මය තුළද සත්ව රැළකට එක්ව වාසය කිරීමට බොහෝ හේතුන් ඇත. එනම් ආරක්ෂාවට, තමාගේ වර්ගයා හඳුනා ගැනීමට, සහයෝගීතාවය ඒ අතර වේ. රැළක බලය විවිධාකාර සිද්ධීන් හෝ කතන්දර තුළින් පුද්ගලයින් බලගැන්වීමට යොදා ගැනේ.

විශේෂයෙන් ඔබ හෝ ඔබේ දරුවන් කරදරයකට පත් වූ විට ආරක්ෂිත ජාලයක් තිබීම වැදගත් වනවා පමණක් නොව සතුටු සාමිච්චියටත් විනෝදයටත් ඔබ වටා මිත්‍ර කණ්ඩායමක් සිටීම ජීවිතය අලංකාර කරයි. අපව කරදරවලට පත් කරන හෝ වැරදි උපදෙස් දෙන ආශ්‍රයට වඩා, ජීවිතයට ප්‍රයෝජනවත් වුත් වැදගත් උපදෙස් දීමටත් සහයෝගය දිය හැකි පුද්ගලයින් සමඟ සමබර සාකල්‍ය (ශාරීරික, චිත්තවේගී, බුද්ධිමය, ආත්මික හා සමාජීය) ක්‍රිස්තියානි ජීවිතයක් ගත කළ යුතු බව වැටහෙන්නේ අභියෝගාත්මක හා තීරණාත්මක අවස්ථාවන් වලදී ය.

එමනිසා අද මෙම කලාපය තුළින් රැළක බලය හෝ එසේත් නොමැති නම් සහයෝගි මිත්‍ර කණ්ඩායම් නිසා ඔබගේ සාකල්‍යමය දියුණුව ඇති කර ගැනීමේ වැදගත් කමත්, එසේ ඇති කරගන්නේ කෙසේදැයි සිතා එය ප්‍රායෝගික කර ගැනීමටත් වෙර දරමු.

මුලින්ම මම ඔබගෙන් ප්‍රශ්නයක් අසන්නෙමි. ඔබගේ රැළේ සිටින හෝ තවත් පහසු කර, ඔබගේ දෛනික ජීවිතයේ ඔබ වැඩිම කාලයක් ගත කරන, ගනුදෙනු කරන, කතා බස් කරන හෝ බලපෑම් ඇති කරන 5 දෙනා කව්ද? ඔබ හොඳින් සිතන්න. ඔවුන්ගේ නම් මතක් කර ගන්න.

ඔබ වැඩිපුරම කාලය ගත කරන පුද්ගලයින් 5 දෙනා මෙන් වන බව ජිම් රෝන් නම් පුද්ගල බලගැන්වීම් දේශකයෙකු පවසා ඇත. එලෙසම "මට ඔබේ මිතුරන් පෙන්වන්න, මම ඔබේ අනාගතය පෙන්වන්නම්" යනුවෙන් ව්‍යවහාරයේ වැකියක් ද ඇත. මෙම වැකි හරහා ඔබගේ සමීප මිතුරු මිතුරියන් ඔබ කව්දැයි යන්න පෙන්වා දෙන අතර ඔබගේ ජීවිතයේ අරමුණ හා හැසිරීම් වැනි වැදගත් කාරණා පවා ඔබ ආශ්‍රය කරන අය මත තීරණය වන බව සිතිය හැක.

කාරණය එසේ නම්, ඔබගේ මුළු හැකියාවට, එනම් දේව අභිප්‍රාය හා සැලැස්ම කරා ළඟා වීමේදී ඔබේ වර්ධනයට හා දියුණුවට දායක වන්නාවූ පුද්ගලයන් ඔබ වටා තබා ගැනීම කොපමණ වැදගත්ද? බලපෑම යහපත් හෝ අයහපත් වුවත් ඔබ ඔවුන් මගින් හැඩගස්වනු ලැබීම ආරම්භ වනු ඇත.

මිතුරන් හා මිතුරෙකු වීම පිළිබඳව බයිබලය බොහෝ දේ පවසයි. **"නපුරු සමාගමෙන් හොඳ චරිත නරක්වන්නේය."** (1 කොරින්ති 15:33) එසේ වන්නේ ඔවුන් ඔබට බලපෑම් ඇති කර ඔබගේ බයිබලීය වටිනාකම් හා විශ්වාසයන් බෙදා නොගන්නා අතර ඒවා පිළිනොගැනීමත් නිසාය. ඔවුන්ට ඔබගේ කිතුනු සදාචාරය (දේව වචනයට කීකරුව නිවැරදි දේ තෝරාගැනීමේ හැකියාව) හීන වී යාමට පවා සැලැස්විය හැකිය. එලෙසම ඔබගේ මිත්‍ර කණ්ඩායමේ බොහෝ අයව වැරදි දිශාව අනුගමනය කිරීමට මෙහෙයවමින් සහ ඒ මාර්ගයේ තිබෙන සියල්ල විනාශ කරමින් ප්‍රශ්න ඇති කිරීමට පවා සැලැස්විය හැක. **"බොහෝ මිත්‍රයන් ඇති කරගන්නා නාස්තියට පැමිණේ: එහෙත් සහෝදරයෙකුට වඩා ඇලුම් වෙන මිත්‍රයෙක් ඇත්තේය."** (හිතෝපදේශ 18:24)

එලෙසම කිතුනුවෙකු වුවද බයිබලීය වටිනාකම් අදාල කරගෙන ක්‍රියාවට නැගීමට පුහුණු නොවීම නිසා ඔබ තුළින් ආශිර්වාදයක් නොවන බවත්, ඔබ හොඳ මිතුරෙකු නොවන බවත්, ඔබ ජීවත්වන ප්‍රජාව තේරුම් ගනී.


ඉහල අධිකාරිත්වයට (සදාචාරයට) යටත් වුත් එම වටිනාකම්වල රැඳී සිට දේව කැමැත්ත ක්‍රියාවට නැංවූ පුද්ගලයෙකුගේ හා ඇසට හරිව පෙනෙන, අන් අය සතුටු කරන බයබලීය චරිත 2කි. මෙය මිතුරන් හඳුනාගැනීමට හොඳ උපදේශයක් වේ. "පිලාත් සමූහයා සතුටු කරන්ට කැමතිව, බරබ්බස් ඔවුන්ට මුදා දී, යේසුස් වහන්සේට තළවා, උන්වහන්සේ කුරුසියෙහි ඇණගසන්ට භාර දුන්නේය." (මාර්ක් 15:15) එලෙසම "බලව, මන්ත්‍රීයෙක්ව දෙවියන් වහන්සේගේ රාජ්‍ය ගැන බලා සිටියා වූ ඔවුන්ගේ මන්ත්‍රණයටද ක්‍රියාවටද එකඟ නුණාවූ, සත්පුරුෂවූ, ධර්මිෂ්ඨවූ,... යෝසෙප් නම් මනුෂ්‍යයෙක්...." (ලූක් 23:50)

බයිබලටය අනුව තෝරාගත් කිතුනු වටිනාකම් ඔබගේ දරුවන්ටද කියා දෙමින් පුහුණු කළ යුතු අතර ආදර්ශය වඩාත් වැදගත් වේ. මිත්‍ර සමාගම් පිළිබඳවත් එසේමය. ඔබ සාමාජය හා ගනුදෙනු කරන ආකාරය හා ඔබේ මිත්‍ර සමාගම දරුවන්ට කදිම පුර්වා දර්ශයකි. ඔවුන් නිරායාසයෙන්ම ඔබව අනුගමනය කරනු ඇත.

ඔබගේ කාරණාවන් අන් අය සමඟ බෙදා ගන්නා අතරම අන් අයගෙන් ඉගෙනීම හා නව දේවල් අත්විඳීමට නම් අන් අය සමඟ ප්‍රජාවේ ජීවත් විය යුතු වේ. අප හුදකලාව ජීවත් නොවිය යුතුය. නමුත් බොහෝ කිතුනුවන් ස්වාධීනව හා පුද්ගලවාදිව සිටින හෙයින් ප්‍රතිස්ථාපනය පවා අත්නොදැකීම දුකට කාරණාවකි. ගෝලත්වයේ ක්‍රියාමාර්ගය එනම් යේසුස් වහන්සේ මෙන් එක්ව පුහුණු වීම අනුගමනය කළ යුතුව ඇත. ඔබට අවශ්‍ය උපකාරය තව කෙනෙකුට අවශ්‍ය වන බව කිතුනුවන් අනුගමනය කළ යුතු බයිබලීය වටිනාකමක් වේ.

**"එබැවින් මනුෂ්‍යයන් විසින් නුඹලාට යමක් යමක් කරනවාට නුඹලා කැමතිද නුඹලාත් එසේම ඔවුන්ට කරපල්ලා."**

(මතෙව් 7:12) (රන් අණ)



සුහද හමුවීම් තුළින් හෝ දුරකතන සම්බන්ධතා හරහා ජීවිතයේ සිදුවීම්, ඔබ කරන දේවල්, තීරණ පිළිබඳව යාවත්කාලීන (දැනුවත්) කල යුතුවේ. විශේෂයෙන් තනි මවකට මෙම මේසයේ උපකාරය කියා නිමකල නොහැකි තරම් වේ. ඇයට ඇගේ දරුවන්ට ඇය වටා සිටින්නන් ආරක්ෂිත වළල්ලක් වැනිය. මානසික සහය හා ජීවිතයේ දැඩි වෙහෙසක් උසුලන ඇයට, විශේෂයෙන් උපදේශිකා භූමිකාව විශාල මෙහෙවරක් හා උපකාරයක් විය හැක.

මොහොතක් සිතන්න! අපි සියලු දෙනාම නිතිපතා විවිධාකාර අනපේක්ෂිත කරදර, ප්‍රශ්න වලට මුහුණ දෙනවා පමණක් නොව අපගේ දුක, සතුට, වේදනාවන් බෙදා ගැනීමට විශ්වාසවන්ත මිතුරන් නොමැතිව තැවෙමින් පසුවන බව පෞද්ලිකව විමසා බැලිය හැක. **විටෙක "මට කවුරුත් අවශ්‍ය නෑ" හෝ "මගේ ප්‍රශ්න, අපේ පවුලේ ප්‍රශ්න අපිම විසඳ ගන්නවා" හෝ තවත් විටෙක "මගේ ප්‍රශ්න බෙදා ගැනීමට සුදුසු පරිණත කෙනෙක්, විශ්වාසවන්ත කෙනෙක් නැහැ" යනුවෙන් කියන්නාවූ බහුතරයක් දෙනා මට මුණ ගැසී ඇත.** මිත්‍ර උපදේශකයෙකු සමග හෝ මිතුරෙකු සමග මිත්‍රශීලීව සිතුවිලි බෙදා ගැනීමේ අත්දැකීම නොලැබීම ගැනත් පරිණතවීමේ අවස්ථාව ගිලිහී යන ආකාරයත්, හුදකලා වූ නායකයින් දකින විටත් මා හට මහත් කණස්සල්ලක් හා තැවීමක් ඇති වේ. මන්ද මනුෂ්‍යන් සියලුදෙනා සර්වසම්පූර්ණ නොවන බැවින් හා ආත්මික පරිණත කෙනෙකු පමණක් නොව විවිධාකාර පුද්ගලයින් තුළින් දෙවියන්වහන්සේ ක්‍රියාකරන ආකාරයට දකින්නට නොලැබෙන බැවිනුත් නිසාම වේ. දෙවියන්-වහන්සේ අප තුළින් යහපත් ක්‍රියා සිදු කරනවා පමණක් නොව, අන් අයව ද අප උදෙසා (දුක, වේදනා, අනාරක්ෂිත සිතුවිලි බෙදාගැනීම සඳහා) යහපත් ක්‍රියාවන් වලට සූදානම් කර ඇති බව විශ්වාස කර යුතුව ඇත. "මක්නිසාද අපි වනාහි යහපත් ක්‍රියා කරන පිණිස ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ මවනු ලැබ දෙවියන්-වහන්සේගේ කර්මාන්තයව සිටිමුව." (එපීස 2:10) එමනිසා යාච්ඤාවෙන් හා දේව මඟපෙන්වීමෙන් ඔබගේ මිත්‍රයින් හා උපදේශකයින් තෝරා ගන්න.

ඔබ ඔබගේ සාකල්‍යමය දියුණුව ගැන සිතීමට කාලය පැමිණ ඇත. ඔබගේ දරුවන්ගේ සාකල්‍ය දියුණුව ගැනද එසේමය. එක් අංශයක් කෙරෙහි පමණක් යොමු වීම හෝ සමහර අංශ නොසලකා හැරීම අණුවන ක්‍රියාවක් නොවන්නේද? මන්ද අප මෙලොව ගත කරන ජීවිතයේදි ආත්මික පරිණත කෙනෙකු සමග පෞද්ගලික ගණන්දීමක් නොමැතිව ගමන් කරන්නේ නම් එය ඉතා භයානක තත්වයකි. "යකඩින් යකඩ මුවහත් වේ, එසේම මනුෂ්‍යයෙ-යක් තම මිත්‍රයාගේ මුහුණ පැහැපත් කරයි." (හිතෝපදේශ 27:17) එය බයිබලයේ නව අනුවාදයට අනුව නම් "...මනසින් මනස දියුණු තියුණු වෙයි" යනුයි.

නමුත් ඔබ අභිප්‍රායිකව මෙම "සහයෝගිතා මේසය" සකසා ගැනීමට කාලය මිඩංගු කර වෙහෙසෙන්නේ නම් එය පෞද්ගලිකව ඔබට හා ඔබේ පවුලේ යහපත උදෙසා කරන්නාවූ අනර්ඝ ආයෝජනයක් වනු නියතය. මදක් සිතා බලන්න, අභියෙ-ෝගාත්මක කාලයන් වලදි දුකෙන් කණස්සල්ලෙන් කාලය වැය කිරීමට වඩා උපක්‍රමශීලිව ප්‍රශ්න වලට සූදානම් වීම වඩා ප්‍රයෝජනවත් නොවන්නේද?

ඔබ ඔබගේ වයස අවුරුදු 20ට අඩු 11ට වැඩි දරුවන් වෙනුවෙන් "සහයොගිතා මේසයක්" පිළියෙළ කිරීමට බලාපොරොත්තු වන්නේ නම් දෙමාපිය අවදානය හා අධීක්ෂණය ඇතිව ක්‍රියාවට නැංවිය යුතු වේ. මෙහිදි උපදේශක භූමිකාව වැඩිහිටියෙකුගේ අවශ්‍යතා-වය වඩා වෙනස් ස්වරූපයක් ගනි. මන්ද දරුවන් සමග වඩා ගැඹුරු තොරතුරු විසඳා ගැනීමට වඩා, විශ්වාසවන්ත උපදේශි-කාවක් හා ජීවිත අත්දැකීම් බෙදා ගැනීමට හුරුවීමක් පමණක් සිදු වේ. එලෙසම උපදේශනය ලබන්නා, පුහුණුව ලබන්නා හා තහවුරු කරන්නා වැනි පුටු තවම පිරී නැත. එය තරුණ වයසට පැමිණීමත් දෙවියන් වහන්සේ ජීවිතය සඳහා අරමුණු කරන කැඳවීම හඳුනා ගැනීමත් හා සමග සමඝාමීව සිදු වේ.

ඔබ වටා මිත්‍ර කණ්ඩායමක් සිටීම මගින් හා ඔවුන්ට ගණන් දීම හා ගණන් ගැනීම තුළින් ඔබ ඔවුන් කෙරෙහි හා ඔවුන් ඔබ කෙරෙහි තබන්නාවූ විශ්වාසය වැඩි වනු ඇත. විනෝදයෙන් යුතු සුහද හමුවීම්, වැදගත් කතා බහ, ආත්මික උපදේශන හා උපදෙස් ලැබීම තුළින් ඔබගේ මනස හා ජීවිතය බබළන සුළු කිතුනු ජීවිතයක් වනු ඇත. අභියෝග වලින් පිරුණු, අවිනිශ්චිත වූ අනාරක්ෂිතභාවයෙන් යුතුව මේ ලෝකයක ගමන් කරන ඔබට දෙවි පියාණන් සපයා ඇති ප්‍රේමයේ ගමන අන් අය හා එක්ව ඇවිදින්න. මෙහිදි එකිනෙකා අතර විශ්වාසය ගොඩනැගෙන අතර විශ්වාසවන්ත කිතුනුවෙකු වීමට පුහුණුවීමක් සිදුවන බව මතක තබා ගන්න. මේ සඳහා ඔබ විසින් යොදවන වෙහෙස, කාලය හා ශක්තිය ඔබගේ දරුවන් තනි නොවූ දරුවන් වීමට ආදර්ශයක් වනු ඇත.

දැනටමත් ඔබගේ ජීවිතයේ විශ්වාසය
තැබිය හැකි පරිණත කිතුනුවන් සහයෝගිතා
මේසයේ අසුන් ගෙන සිටිනවාද?


ඔබ අවවාද අනුශාසනා ලබන
කිතුනු පුද්ගල නාම මොනවාද?

ඔවුන් ඔබගේ සාකල්‍ය වර්ධනයට දායක වන්නාවූ
හැකියාවන් තහවුරු කරනවාද?

ඔබ වෙනුවෙන් කවුරුන් හෝ
දිනපතා යාච්ඤා කරනවාද?

නැවතත් ඔබගේ මතකයට

"ඔබගේ මිතුරු මිතුරියන්
තෝරාගැනීම
ඔබ කව්ද යන්න
පෙන්වා දෙයි"



සිමොනෙ ක්ලෙමන්ට්
ක්‍රිස්තියානි රෙපරමාදු සභාව
ගාල්ල

# විලාසිතා මන බඳිනා විලාසිතා



ඇඳුම් පැළඳුම් හී දක්නට ලැබෙන විවිධාකාර වු හා එකිනෙකට වෙනස් මෝස්තර, වර්ණයන් හා රටාවන් හේතුවෙන් "විලාසිතා" යන වචනය නිර්මාණය වී ඇත. ඇඳුම් පැළඳුම්වල අවශ්‍යතාවය ද අද ඊයේ පුද්ගල මනසට ඇතුල් වුවක් නොවේ. ශුද්ධවූ බයිබලයට අනුව පළමු පුරුෂයා සහ ස්ත්‍රිය දක්වාම ඇඳුම් පැළඳුම් හී අතීත කතාව දිව යයි. උත්පත්ති 3 වන පරිච්ඡේදය එය මෙලෙස විස්තර කරයි.

"එවිට ඔවුන් දෙදෙනාගේම ඇස් ඇරී තමන් නග්නව සිටින බව ඔවුහු දැනගත්තෝය." (උත්පත්ති 3:7 අ)
"ඔවුහු අත්තික්කා කොළ මහා තමන්ට ඉණවැසුම් සාදා ගත්තෝය." (උත්පත්ති 3:7 ආ)

මින් පැහැදිලි වන්නේ ඇඳුම් පැළඳුම් හී මූලික කාර්යය භාරය වූයේ නිරුවත ආවරණය කිරීම බවයි. අනෙක් අතට ඇඳුම් පැළඳුම් මගින් සංකේත-වත් කර ඇත්තේ අපගේ පාපය හා ලැජ්ජාව වසා ගැනීමේ අවශ්‍යතාවයයි.

විලාසිතාව මනෝවිද්‍යාව (Fashion Psychology) පෙන්වා දෙන ආකාරයට "අප අඳින පළඳින ආකාරය අපගේ අවශ්‍යතාවය පෙන්නුම් කරන අතර, එය සමාජ සංඥා යවන ප්‍රධාන මාධ්‍යයක් ලෙස ක්‍රියා කරයි." එනම්, බාහිර ඇඳුම් බොහෝ අවස්ථාවන්හී අභ්‍යන්තර යථාර්ථයක් සංකේතවත් කරන බවයි. මේ සඳහා නිදසුන් කීපයක් බයිබලීය අනුසාරයෙන් ගෙන බලමු. බේදවා-චකයන් ගැන වැලපීම නිරූපනය කිරීමටයි.

❑ බයිබලය පුරාවටම සුදු ඇඳුම පවිත්‍රත්වය සංකේතවත් කරයි. යේසුස් වහන්සේගේ රූප විපර්‍යාසයේදී උන්වහන්සේගේ වස්ත්‍ර "ආලෝකය මෙන් සුදු විය." (මතෙව් 17:2)

❑ සම් පටි දරිද්‍රතාවයේ හෝ තපස්කමේ සළකුණක් විය. එලියා සහ යොහාන් බව්තීස්ත යන දෙදෙනාම සම් පටි පැළඳ සිටියේය. (2 රාජාවලිය 1:8 / මාර්ක් 1:6)

මින් අර්ථවත් වන්නේ පුද්ගලයෙකුගේ අලංකරණයට ඇඳුම් පැළඳුම් හෝ විලාසිතා සමග සෘජු සම්බන්ධතාවයක් නොමැති බවයි.

"නුඹලාගේ අලංකාරවීම හිසකේ ගෙතීමද ස්වර්ණාභරණ පැළඳීමද නොහොත් වස්ත්‍ර හැඳීමද යන පිටත අලංකාරය නොව, දෙවියන්වහන්සේ ඉදිරියෙහි ඉතා අනර්ගව තිබෙන මෘදුවූ නිශ්චලවූ ගතියක් නමැති දිරා නොයන සැරසීමෙන් යුක්ත වූ සිතේ ඇතුල් මනුෂ්‍යයා වේවා." (1 පේත්‍රුස් 3: 3,4)

කෙසේ වෙතත් විලාසිතා හෙළා දැකීමක් හෝ විලාසිතා කිරීම යුතු නොවේ යනාදි අදහස් මින් ඉදිරිපත් නොකරයි. අප කැමති ආකාරයට ඇඳීමට සහ පැළඳීමට අපට අයිතියක් මෙන්ම නිදහසක් ඇත. නමුත් අප අපේක්ෂා නොකරන පණිවිඩයක් අපගේ විලාසිතා තුළින් අන්‍යයන්ට නොලැබෙන පිණිසත්, අනෙකා පරීක්ෂාවට නොවැටීමටත්, දේව දරුවෙකු ලෙස දෙවියන්වහන්සේගේ ගෞරවයට හානි නොවන අයුරිනුත් විලාසිතා කිරීමට අප විසින් වග බලා ගත යුතුය. එය අපගේ වගකීමකි.



චාමි නන්දුපා
මනෝ විද්‍යා විශේෂවේදී
ගාල්ල දේවස්ථානය

ආදරණීය දුවේ පුතේ,

පසුගිය කලාපයෙන් අපි ආබ්‍රහම් තම පුත් ඊසාක්ව දෙවියන් වහන්සේට පූජා කරන්නට යන විට සිදු වූ පුදුම දේ ගැන ඉගෙන ගත්තා. අද එතැන් සිට ඉදිරියට සිදු වූ දේ ගැන තොරතුරු දැන ගමු.

කාලය කෙමෙන් කෙමෙන් ගත වුණා. ඊසාක් දැන් විවාහ වෙන වයසටත් ඇවිදින්. තමන් ඉතාමත් වයෝවෘද්ධව සිටි නිසා ආබ්‍රහම්ට තම පුතාට බිරිඳක් සොයන කාර්යය කරන්න අපහසු වුණා. ඒත් ආබ්‍රහම්ගේ නිවසේම ඉතාමත්ම විශ්වාසවන්ත සේවකයෙක් සිටියා. ඔහුගේ නම එලියේසර්.

දිනක් අබ්‍රහම් එලියේසර් කැඳවා, "මාගේ උපන් දේශය වෙත යන්න. මාගේ නෑදෑයන් අතරින් මාගේ පුත්‍රයාට මනාලියක් ගෙන එන්න" යි කීවා. එලියේසර් ඉතා විශ්වාසවන්ත මෙන්ම, ප්‍රඥාවෙන් පිරුණු දෙවියන් වහන්සේ සමඟ මනා සම්බන්ධතාවයක් ද තිබූ අයෙක් වුණා.

මේ නිසා එලියේසර් ගමනට අවශ්‍ය සියළු දේ ඇතුළු තෑගි බෝග ද සූදානම් කර ගත්තා. ඔටුවන් දස දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් සමඟ ඔහු අබ්‍රහම්ගේ උපන් ගම වන කානාන් දේශයට පිටත් වුණා.

කානාන් වලට පැමිණි එලියේසර් ළිඳක් ළඟ සිට දෙවියන් වහන්සේට මෙසේ යාච්ඥා කලා. "මේ ළිඳෙන් වතුර ගෙන යාමට පැමිණෙන තරුණියකගෙන් මා බීමට වතුර ඉල්ලූ විට, ඇය මට බීමට වතුර දී මාගේ සතුන්ටද වතුර දෙන්නෙම් යි පවසන්නේ නම්, ඇයව ඊසාක්ගේ මනාලිය කර ගැනීමට දෙවියන් වහන්සේ තෝරා ගත් තැනැත්තිය වේවා" යි පැවසුවා.

සුළු මොහොතකට පසු වතුර ගෙන යාමට තරුණියක් ළිඳ ළඟට ආවා. එලියේසර් ද ඇයගෙන් බීමට වතුර ඉල්ලූ විට, ඇය ඔහුට වතුර දී, සතුන්ටද බීමට වතුර ඇද දුන්නා. ඇය බෙතුයෙල් ගේ දියණිය වූ රෙබෙකා යි.


ඇයගේ නිවසට ගිය එලියේසර්, ආබ්‍රහම් සහ ඔහුගේ පුත් ඊසාක් පිළිබඳ සියල්ල දැන්වූ පසු ඔවුන් මෙන්ම රෙබෙකාද මෙම විවාහයට කැමති වුණා. දෙවියන් වහන්සේට ස්තූති කරමින් එලියේසර් ගෙන ආ තෑගි බෝග ඔවුන් වෙත ලබා දී, රෙබෙකා රැගෙන ආබ්‍රහම්ගේ නිවස වෙත ගියා. ඊසාක් ද රෙබෙකා මෙසේ සරණ පාවා ගත්තා. ඔහු ඇයට බොහෝ සේ ආදරය කලා.

අපිත් එලියේසර් වගේ විශ්වාසවන්ත, ප්‍රඥාවන්ත, දෙවියන් වහන්සේ සමඟ මනා සම්බන්ධතාවයක් ඇති උන්වහන්සේගේ සේවකයෝ වෙමු.

මිහිරි නැන්දා



එලියේසර්ට රෙබෙකා වෙතට යන්න පාර සොයා දෙන්න.



ලස්සනට පාට කරමු.



# මන්නා සපිරි ඇදහිල්ල කරා

රළ වලින් පිරුණ වෙරළක් සහිත තෙරක් දෙස අපට බොහෝ වෙලා බලා සිටිය හැකිය. අලංකාර දසුනක් මවන එම ක්‍රියාදාමය යහපත් කිතුණුවෙකුගේ ආත්මික දිවියක පැතිකඩක් පෙන්වයි. වෙරළට වැදෙන රළ නිසා ශක්තිමත්, මටසිලුටු වෙරළ පථයක් නිර්මානය කරයි. දේව වචනය මගින් ආත්මික මන්නා බොජුන් නිතිපතා ලැබේ. එය කිතුණුවාට යෝධ ශක්තියකි. ඇදහිල්ලට වාරුවකි. ඇදහිල්ලේ කතුවරයා වෙත ලං විය හැක. පරණ ගිවිසුම තුළ ලක්ෂ 24 පමණ යුදෙව් සෙනඟ කානාන් දේශයේ ගමන් කරන විට, එහි නායකත්වය දැරූ මෝසෙස්ට ආහාර සපයා දීමේ ගැටළුවට පිළියමක් ලෙස දෙවිඳුන් මන්නා බොජුන් ඔවුන්ගේ නඩත්තුවට ආහාරයක් ලෙස ලබා දුන් සේක. එය ස්වර්ගීය බීජයකි.

ඔවුන්ගේ මූලික අවශ්‍යතාවය වූ ශාරීරික පෝෂණය ඉන් සිදුවිය. නමුත් භාවිතයෙන් ම එයට ආත්මික මන්නා යයි කියනු ලැබේ. මෙම ආත්මික මන්නා අනුභවය නිසා මිනිසා සහ දෙවිඳුන් අතර නැතිවී ගිය සබඳතාවය යළි ගොඩනැගීම දෙවිඳුන්ට පුදන ගෞරව නමස්කාරය, අනාගත වාක්‍ය ඉටුවීම විශ්වාස කිරීම, දෙවියන්වහන්සේගේ සාක්ෂිය ප්‍රදර්ශනය කිරීම වැනි ගැඹුරු තලයේ සිද්ධාන්ත කිතුණුවා තුළ නිදන්ගත වේ. යේසුස්වහන්සේගේ වඩා උතුම් නැවත නැගිටීමේ ක්‍රියාවලිය හමුවන තුරු දැඩි අභිලාෂයකින් පසුවන කිතුණුවා වාසනාවන්තය.

21 වන සියවස වන විට ලෝක ප්‍රජාව විශ්ව දැනුම අතින් ඉතා ඉහළ මට්ටමකට පැමිණ ඇත. නමුත් එහි විශාල හිඩසක් ඇත. එය කුමක්ද? එය දුක් සහිතය. මැවුම්කරුවාණන්ගේ අසීමිත සැපයීම කෙරෙහි කෘතගුණ භාවයක් නොමැති වීම සහ මුළු මැවිල්ලම විනාශ කිරීම යන කරුණු ඒ අතර වේ.

නපුර සහ ජීවනය දැනගැනීමේ ගසින් ගෙඩි අනුභව කිරීමෙන් අනතුරුව මිලියන ගණනින් ලෝක ප්‍රජාවක් වර්ධනය වුවත්, යේසුස්වහන්සේගේ ශුද්ධ රුධිරයෙන් මිලදී ගත්තාය යන සත්‍ය දැහැමි සිතුවිල්ලෙන් බොහෝ දෙනෙක් ඉවත් වී ඇත. ඔවුන් සාතන්ගේ සේවා සපයන සේවා දායකයන් බවට පත්වී අවසන්ය.

ආදම් හා ඒව යන යුවලට දුන් ස්වර්ගීය අත්දැකීමට විරුද්ධ වීම, මානව ඉතිහාසයේ දෙවි-මිනිස් සබඳතාවය පුපුරා ගිය මහා ඛේදවාචකයකි. ඇතමුන්ට මෙය හිස් සිදුවීමක් පමණි. අන්ධකාර මුලාදැනියාගේ ආධිපත්‍යයට ලොව අත්පත් කර දීමේ ක්‍රියාවලිය උත්පත්ති 3:13-15 පදයන්හි සඳහන් වේ. සුන්දර මිහිම-ඩලේ මිනිසා විසින් මන්නා අහිමි කර ගෙන නොඇදහිලිකාර මනුෂ-ප්‍යයන් කෙරෙහි විශ්වාස තැබීම වනාහි වචනයේ "මන්නා රසය" නොදන්නා බව ප්‍රදර්ශණය කරවන්නකි.

දෙවිඳුන් තමන් විසින් මවන ලද මිනිසා සමඟ නිවැරදි සම්බන්ධතාවය නැවත ගොඩනගා ගන්නා තුරු ඒ උතුම් උත්සාහය අත්නොහරියි. උත්පත්ති 3:15 "ඒ වංශය තාගේ හිස පොඩි කරන්නේය. තෝ ඔහුගේ විලුඹ පොඩිකරන්නෙහිය." මෙම අනාගත වාක්‍යය ඉටුවන තුරු අදෘශ්‍යමානවද, වැඩ වසයි.



කාලයාගේ ඇවෑමෙන් ආදම් වටා ගොඩනැගුණ ලොව අවසන් විය. ඉන් අනතුරුව සාතන්ගේ පරපුරට නෑකම් කියන කොටසක් බිහිවූ අතර දඬුවමත් විසඳුමත් දෙවියන්වහන්සේ විසින් තීරණය කරනු ඇත.

විශ්වාසවන්ත දෙවිඳුන් වටා රොද බදින කිතුණුවා සමඟ නැවතත් එඬේරෙක් කේන්ද්‍රය කරගෙන ලොවක් නිර්මානය කිරීමට නයිල් තෙර අසලදී මෝසෙස්ව තෝරා ගන්නා ලදී. එවකට යුදෙව්-වන්ගේ පියා බවට පත්වූයේ මොහුගේම වුවමනාවෙන් නොවේ. දෙවියන්වහන්සේ විසින් මිසරයේ ඵාරාවෝ රජුගේ වහල් සේවයේ නියැලුණ පීඩිත සෙනඟට කානාන් දේශය නිජබිම බවට පත්කර දීම ඔවුන් ලද උතුම් ත්‍යාගයක් විය. එතුමාණෝ හාස්කමේ දෙවිඳුන් බව ඔවුහු පිළිගත්හ. පෙරළා එම කෘතඥභාවය ඍජුවම ප්‍රකාශ කරන ලද්දේ ඉතාම කෙටි කාලයකට පමණි.



සාතන්ගේ ලෝකය දෙවිඳුන්ගේ ආත්මික ලොව අභිබවා යමින් අන්‍ය දෙවි නමස්කාරය වැනි අපිළිකුල් සහගත ක්‍රියා දාමයන්ගෙන් මුලු ඊශ්‍රායෙල් දේශය වසා ගත්තේය. මිනිසා සමඟ නැති වු සබදතාවය නැවත සක්‍රිය කරගැනීමට ක්‍රමවේදයක් අවශ්‍ය විය. කාලීන අවශ්‍යතාවයක් වු නොහික්මවු මිනිසා හික්මවීමට දෙවියන්වහන්සේ දසපනත ලබාදීමෙන් උපකාර කරන ලදී. නමුත් ඔවුහු පසු කාලයේදී සාතන්ගේ බොරු ඉගැන්වීම් වලට නතු වුහ. භෞතිකව මන්නා අනුභව කලද, ආත්මික මන්නා වල රස නොබැලීමෙන් සෙනඟ විනිශ්චය කරුවන්ගේ පාලනය අවසන් කරමින් රජෙක් ඉල්ලා මොර ගැසුහ. මෙලෙස ඔවුන්ගේ ප්‍රථම රජ සාවුල් විය.

නමුත් සිදුවුයේ කුමක්ද? සර්වබලධාරි දෙවිඳුන්ගේ බල මහිමය ඔවුන් අත්දුටුවද, බැබිලෝනියානු දේව පිදිම වැනි අකටයුතු දේවල් කිරීමට ඔවුහු පෙළඹිණ. බොරු එඬේරුන්ගේ හඬට ඔවුන් මුලා විය. එහෙත් මැවුම්කාර දෙවිඳුන්ගේ අරමුණ තවම ඉටු වී නොමැත. යුදෙව්වන් ප්‍රධාන කරගත් මිනිසා මන්නා නිසි පරිදි බුක්ති විඳ නැත. දෙවිඳුන්ට තම කාරිය කර ගැනීමට තවමත් ආත්මික කාලය නිර්මාන වී නැත.

මෙයට විසදුමක් ලෙස දෙවිදාණන් යොහාන් බෞතීස්ත පහන් ආලෝකයක් ලෙස තෝරා ගත් සේක. පසුකලකදී ඔහු ඊශ්‍රායෙල් දේශයේ ලියන්නන්, පරිසිවරුන්, සද්දිසිවරුන්, සහ අන්තවාදී යුදෙව්වන් සමඟ වාද විවාද පවා ඇති විය. පසුව අනාගතවාක්‍ය ඉටු වීමක් ලෙස කන්‍යාවකගේ දරු ගැබකින් ඒ ප්‍රථම බැටළුපෝතකයාණෝ බිහි කළ සේක. එතුමාණෝ මිනිස් සංහතියේම ගැලවුම්කරු විය.

නමුත් එම සමාගමට අයත් වුයේ ගෝලයන් 12 ක් ඉතා සුළු ශ්‍රාවක පිරිසක් පමණි. ඊශ්‍රායෙලයේ සුප්‍රසිද්ධ ගලීලය ප්‍රදේශය පුරා දේව අණ, දේව වචනය සංවරණය විය. අන්‍ය ජාතීන් වෙතටද එය යායුතු ව තිබුණි. මෙකී ගෝල පිරිස එම වචන ඇතුලත් බයිබලය ගල් ගුහා අස්සේ සඟවා ගනිමින් රැකගෙන ආ තොරතුරට හිස නමා ගරු කල යුතුය. ඔවුහු වේද සාක්ෂි මරණ අතරට එක් විය. යොහාන් පත්මොස් දුපතේ හිරකරුවෙක් විය.




මින් යේසුස්වහන්සේගේ ලයේ සැතපී හුන් යොහාන් තුමාට ඉදිරිය පෙන්වා දෙන ලදී. එය එළිදරව් පොතේ සඳහන්ය. යේසුස්වහන්සේගේ දෙවන පැමිණීම සම්බන්ධව එළිදරව්ව මෙතෙක් ඉටු වී නැත. එය අත් දුටු වෙමින් පවතී. ජෙරමියා 8:19-23 දක්වා ගාවිනා විදින මෙම මහත් වු මැවිල්ලම එම එළිදරව්ව ලබා ගැනීමට මහත් ඇදහිල්ලෙන් බලා සිටියී. එසේම මැවිල්ල විනාශ වු පෘථිවිය දෙස බලා කණගාටු වන අයුරුද පෙන්වා දී ඇත.

අප නිවැරදි ලෙස මන්නා බුක්ති විඳිමින් සුදුසුම ඇදහිල්ලේ පංගුකාරකම ලබා ගත යුතුය. 1 කොරින්ති 21:23 පදවලට අනුව ස්වකීය ප්‍රඥාවෙන් දේව වචනය ඇදහිය නොහැකිය. විශේෂයෙන්ම ශක්තිමත් ඇදහිල්ලකට අනාගත වාක්‍ය ඉෂ්ඨ වීම පිළිබඳ අවබෝධයක් නිවැරදිව තිබිය යුතුය. අනාගත වාක්‍ය ඉෂ්ඨ නොවී කරන දේශණාව මෝඩ කමක් ලෙස පදයේ පෙනේ. නැවත පැමිණීම සදාකාල ජීවනය ගැන ඇති 100% විශ්වාසයකින් සහ ඇදහිල්ලකින් හදවත ස්පර්ශ විය යුතුය. එතුමන්ගේ දෙවන පැමිණීමේදී අපට යහපතක්ම වේ.

කෙසේ වුවත් විශාල පීඩා මැද ගමන් කරන කිතුණුවාට වචනය රාජාලියෙකුගේ ශක්තිය සපයයි. බයිබලය ශක්තියේ උල්පතකි. කාන්තාරයේ පර්වතය බිඳ වතුර ලබා දී ස්වර්ගීය මන්නා ලබාදුන් ඇදහිල්ල එයින් හමුවේ. සාගත දවසේදී එලියාට පක්ෂියෙකු තුළින් ආහාර සපයා දීමට එලියාට තිබු ඇදහිල්ල ගැන එහි ඇත. තෙල් කුලාව දෙගුණ තෙගුණ වී සහනයක් ලබා ගත් සාරපත් හි වැන්දඹුවගේ ඇදහිල්ල බයිබලයෙන් අපට ශක්තියක් ගෙන දෙයි. මාංශ නොවළඳා ශක්තිමත්ව සිටි දානියෙල් සහ මිතුරන්ගේ ඇදහිල්ල ඔබටත් මටත් තිබේද? ආබ්‍රහම්ට කදු මුදුනකදී බැටළු පැටවෙක් සපයා දීමට සමත් වු ඇදහිල්ල බයිබලයෙන් හමුවේ.

**නියත වශයෙන්ම දෙවියන්වහන්සේ**
**අප ලඟම සිටියි. අපගේ ප්‍රශ්ණ තුළ සිටියි.**
**නිහඬ ඇදහිල්ල තුළ සිටියි.**
**එවිට වචනයේ ශක්තිය ඔබට කථා කරයි.**
**ඒ ඔබේත් මගේත් ආබ්‍රහම්ගේත් දෙවිඳුන්ය.**
**ඊට සවන් දී අස්වැසිල්ලක් ලබා ගනිමු.**
**ආමෙන්....**




කථිකාචාර්ය
පී.අසෝකා ජයලත්

# කුරුස දේවස්ථානය

## යාපනය කොටුව


ශ්‍රී ලංකාවේ ඕලන්ද රෙපරමාදු සභා කතාන්දරයේ අමතක වූ පරිච්ඡේදයක්.

වේල්ස් සිට ලංකාවට පැමිණෙන සෑම අවස්ථාවකම අප චාරිකාවේ ප්‍රධාන අංගයක් වන්නේ ඕලන්ද රෙපරමාදු නොහොත් ක්‍රිස්තියානි රෙපරමාදු දේවස්ථාන හා ඒවායේ නමස්කාර කරන අප පවුලේ සාමාජිකයන් හා මිතුරන් බැහැදැකීමයි. ගාල්ල (මව් සභාව), මාතර, කොළඹ, ආදුරුප්පුවීදිය යන දේවස්ථාන ශ්‍රී ලංකාවේ පැරණිතම ඕලන්ද දේවස්ථාන ලෙස සැලකෙන අතරම, ඒවා වර්තමානයේ සක්‍රියව පවතින පැරණිතම දේවස්ථාන බවද සත්‍යයකි. මාතර දේවස්ථානය 1706 කැප කර ඇති නමුත් එහි 1656 තරම් පැරණි සොහොන් ගල් දක්නට පවතී. ගාල්ල දේවස්ථානය 1755 කැප කල නමුත් එහි අත්තිවාරම් 1682 දක්වා කාලයට දිව යයි. ආදුරුප්පුවිදිය දේවස්ථානයද අත්තිවාරම් තබනු ලැබුවේ 1742 වන අතර 1757 කැප කරන ලදී.



මාතර, ගාල්ල, ආදුරුප්පුවීදිය යන දේවස්ථානයන් පිළිබඳව ඉතා පැහැදිලි වාර්තාවන් තිබුණද යාපනයට 2022 ජූලි මාසයේ ජීවිතයේ පළමු වතාවට කල චාරිකාවේදී අපි සොයා ගත්තේ ගාල්ල හා ආදුරුප්පුවීදිය දේවස්ථාන කැප කිරීමට වසර 50 කට පමණ පෙර "කුරුස පල්ලිය" (Kruys Kerk) ලෙසින් අලංකාර දේවස්ථානයක් ලන්දේසීන් විසින් යාපනය කොටු පවුර තුළ ඉදිකර ඇති බවයි. යාපනය කොටු පවුර තුළ වටපිටාව නැරඹීමේදී කණගාටු ලෙස කුරුස පල්ලියේ ඉතිරි වූ සුන්බුන් ස්වල්පයක් පමණක් දැක ගන්නට හැකි වූ අතර එහි පළමු ඕලන්ද රෙපරමාදු දේවස්ථානය පිළිබඳව සොයා බැලීමට කුකුසක් ඇති විය.


යාපන කොටුවේ කුරුස පල්ලියේ ඉදිකිරීම් ඇරඹී ඇත්තේ කල්පිටිය දේවස්ථාන මෙන්ම 1706 දීය. මෙම ඉදිකිරීම් ව්‍යාපෘති නිසා ලන්දේසීන් සෑහෙන කාර්යබහුල වන්නට ඇති බව සිතිය හැකිය. පෘතුගීසීන්ගෙන් 1655 දී යාපන කොටුව අත්පත් කරගත් ලන්දේසීන් එය විශාල කර 1680 දී පැති පහකින් සමන්විත තරු (තාරකා) කොටුවක හැඩයට පත් කළහ. ගාලු කොටුවට පමණක් දෙවැනි වන අක්කර 25 ක භූමිභාගයකින් හෙබි යාපන කොටුව පළමු වතාවට පැමිණෙන අමුත්තන්ට ඉතාමත් සිත් ගන්නා සුළු වේ.



කුරුස පල්ලිය තුළ 600 දෙනෙකුට පමණ අසුන් ගැනීමට ඉඩකඩ තිබුණි. එය ග්‍රීක කුරුසියක එනම් ධන ලකුණක හැඩය ගෙන ඇති අතර සතර පැත්තෙන්ම සමාන දිගකින් යුක්ත මැද පළල් ප්‍රදේශයකින් සමන්විත විය. පොළොව මතුපිට 1660 වසර තරම් පැරණි සොහොන් ගල් අතුරා ඇත. ඒවා දේවස්ථානය ඉදිකිරීමට ප්‍රථම භූමදානය කල හෝ අළු තැන්පත් සොහොන් යයි විශ්වාස කෙරේ. 1985-2009 කාලවකවානුවේ පැවති යුද තත්වය හේතුවෙන් ඇතැම් සොහොන් ගල් යාපන අර්ධද්වීපයේ වඩුකෝට්ටේ ප්‍රදේශයේ දේවස්ථානයකට සංරක්ෂණය සඳහා යැවූ බවටද විශ්වාස කෙරේ. අවාසනාවකට මෙවර ගමනේදී එම සොහොන් ගල් දැකබලා ගැනීමට වඩුකෝට්ටේ ප්‍රදේශයට යෑමට අප හට අවස්ථාවක් නොලැබිණ.

1795 දී කොටුව බ්‍රිතාන්‍යයන් අතට පත්වීමත් සමඟ බ්‍රිතාන්‍ය හමුදා දේවස්ථානය බවට කුරුස පල්ලිය පරිවර්තනය වී ඇත. 1872 දී යාපන නගරය තුළ වූ එම දේවස්ථානය බ්‍රිතාන්‍යයන්ගේ නමස්කාරය සඳහා භාවිතා වුණු අතර, 1948 නිදහස ලබන තෙක් යාපනය කොටුව හමුදා කඳවුරක්ව පැවතිණ. ඉන් අනතුරුව කුරුස පල්ලිය අත්හැර දැමීමත් සමග එය කෙමෙන් කෙමෙන් දිරාපත් වීම ඇරඹුණි. කෙසේ වුවද පහත දැක්වෙන 1966 දී ගත් ඡායාරූප තුළ කිසිදු ගරාවැටීමක් නොමැතිව දේවස්ථානය දිස්වේ.


ත්‍රස්තවාදීන් විසින් 1986 සිට 1995 දක්වා සිවිල් යුද්ධයේදී යාපනය නගරය පාලනය කළේය. මේ අතරතුර 1990 දක්වා ශ්‍රී ලංකා රජයේ හමුදාවක් යාපනය කොටුවේ රඳවා තිබිණ. මේ නිසාම මෙම කාලවකවානුව තුළ කිහිප වතාවක්ම යාපනය කොටුව ත්‍රස්තවාදීන්ගේ ප්‍රහාරයන්ට හසු විය. එමගින් කුරුස පල්ලිය ඇතුළු තවත් බොහෝ ගොඩනැගිලි විනාශයට මෙන්ම දැඩි හානියට පත් විය. 1995 පසු කාලයේදී දේවස්ථානයේ තිබූ බොහෝමයක් දේවල් රැගෙන ගොස් පැවති යුද්ධයෙන් හානි වූ තම නිවෙස් පිළිසකර කර ගැනීමට සාමාන්‍ය ජනතාව භාවිතා කර ඇති බවට විශ්වාස කරයි.




වර්තමානයේ කුරුස පල්ලිය මහිමාන්විතව පැවැති ස්ථානයේ කැඩුණු බිත්ති හා නටඹුන් පමණක් දැක ගන්නට හැකිවේ. ඊට යාබදව වූ රැජිනගේ නිළ නිවසද වූ අතර, යුද්ධයේ සලකුණු ලෙස රතු ගඩොල් බිත්තිවල පමණක් ඉතිරිව තිබූ නමුත් එහි සංරක්ෂණ කටයුතු සිදු කොට ඇත.මේ තුළ එක් කලෙක බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයෙක්ද, අනතුරුව ශ්‍රී ලංකාවේ ආණ්ඩුකාර ජෙනරාල්වරයාද 1948-1972 හා එතැන් සිට ශ්‍රී ලංකා ජනාධිපතිගේ යාපනය නිල නිවාසය ලෙසද පැවත චිත් ඇත. 1995 දී දින 50 දිගු සටනකින් පසුව යාපන කොටුව හමුදා බලය යටතට පත්විය. එතැන් පටන් යාපනය කොටුව තුළ නැවත යථා තත්වයට පත්කිරීම සඳහා බොහෝ සංරක්ෂණ කටයුතු සිදුව ඇත. කොටු පවුරේ පිටස්ථරයද හොඳින් ප්‍රතිස්ථාපනය කර ඇත. එහෙත් කුරුස පල්ලිය හා අනෙකුත් ගොඩනැගිලි පිළිසකර කිරීමට කිසිවක් කර නොමැති ලෙස පෙනෙන්නට ඇති අතර යුද්ධයේ අවාසනාවන්ත මතක සාක්ෂි සටහන් ලෙස පමණක් එවා දක්නට ලැබීම ඛේදනීය කරුණකි.




මෙහි සටහන්ව ඇති ඇතැම් චිත්‍ර හා ඡායාරූප මගින් කුරුස පල්ලිය පැවති ආකාරය පිළිබඳව අදහස් ලබා ගෙන ඇත. පහත දිය සායම් චිත්‍රය මගින් දේවස්ථාන ඇතුලාන්තය, ගාල්ල පල්ලියේ හා ආදුරුප්පුවීදිය පල්ලියේද අපි දකින ඕලන්ද ගෘහ නිර්මාන ශිල්පයට සමානතාවයක් දක්නට ලැබේ.



අපගේ බලාපොරොත්තුව නම් මෙම ලිපිය හරහා ක්‍රිස්තියානි රෙපරමාදු සභාවේ සාමාජිකයන් තුළ කුරුස පල්ලිය ගැන උනන්දුවක් ඇති කරලීමත්, යාපනය නගරය ඉතාමත් සුන්දර නගරයක් බවත් දැනුවත් කිරීමයි. මේ තුළින් යාපනය නගරය හා යාපන කොටුව නැරඹීමට යාමට අවස්ථාවක් උදාකර ගන්නේ නම් එය ඔබටද යම් විශේෂ අත්දැකීමක් වනු නොඅනුමානය. වර්තමානයේද කොටුව තුළ හමුදා කඳවුරක් පැවතියත් සුළු ප්‍රවේශ ගාස්තුවක් ගෙවීමෙන් ඊට ඇතුළු විය හැකි අතර, පෙර මෙන්ම නිදහසේ ඒ තුළ ගමන් කිරීමට හැකියාව ඇත. කුරුස පල්ලියට සිදුවී ඇති හානිය අනුව එය ඒ අයුරින්ම නැවත පිළිසකර කිරීම කළ නොහැකි දෙයක් වුවත්, මෙම අලංකාර ගොඩනැගිල්ලේ නටඹුන් පුදුමාකාර මෙන්ම දුක්බර කථාවක් ප්‍රකාශ කරන්නේ අවුරුදු 300 කට වැඩි ඉතිහාසයක් ඇති අප ශ්‍රී ලංකාවේ ප්‍රථම ඕලන්ද දේවස්ථානයක් පිළිබඳවයි.








හෙළ කිතු සසුනේ දෑ අභිමන්
අපි වෙමු එහි උරුමය ලැබුවන් //

වරෙල්ලා සමිඳුන් හදම අරන්
දේව රජය බිහිකරපල්ලා
වරෙල්ලා නොනිඳා නවෝදයට
අවදි වෙයල්ලා

ආදුරුප්වීදිය උස් කඳු මුදුනේ
මහ දෙව් මැඳුරක් ඉදිවන්නට විය
ග්‍රීක කුරුසියේ හැඩයෙන් ඉදිවුනු
කොළොම්තොටේ වූ මහ අභිමානය


වරෙල්ලා......


ප්‍රතිසංස්කරණයේ හිරු කිරණින් වැඩි
දෙව් වචනයේ අධිකාරී බලයෙන්
දෙව් දස් මතයස් යදිමින් කැප කළ
සේවය පැතිරෙයි කිතු ගොස නගමින

වරෙල්ලා......

සිංහල සේවයේ තිස් වසරක් අප
පසු කර ආ මේ මතක ගමන් මග
ඉරුදින පාසැල් දරුවන් ලෙස අද
සමිඳුන් හට තුති දෙමු අපි දෙලෙසින

වරෙල්ලා......//
නොනිඳා නවෝදයට අවදි වෙයල්ලා ///





නිමල්කා කුලසේන සහ
රිචඩ් පියර්ස් හිගින්සන් විසිනි.
වර්නමන්, වේල්ස් සිට

# කුරුසිය දෙකට බෙදෙයි

ශු: ලූක් 23:39-43

යේසුස් වහන්සේ කුරුසපත් කරන විට උන්වහන්සේගේ දෙපැත්තේ සොරුන් දෙදෙනෙක් ඇණ ගසන ලදී. මේ මනුෂ්‍යයන් දෙදෙනා මැද කුරුසියේ ඇණ ගසනු ලැබූ යේසුස් වහන්සේ නිසා පැති දෙකකට බෙදුනි. ලොව පළමුවෙනිම බෙදීම ඇති කලේ දෙවියන් වහන්සේය. මන්ද උන්වහන්සේ ආලෝකය මවා අන්ධකාරයෙන් ආලෝකය වෙන් කල සේක. අන්ධකාරය නැති කළ හැක්කේ ධර්මිෂ්ඨ හා සත්‍ය ආදී ආලෝකයට සමාන කල හැකි දෙවියන් වහන්සේ තමන්ගේ වචනය තුළින් දෙන්නාවූ දේවල් වලටය.


මෙම සොරුන් දෙදෙනා සමාන කළ හැක්කේ පව්කාර සමාජයටයි. මන්ද යත් "සියල්ලෝම පව් කොට දෙවියන් වහන්සේගේ මහිමයෙන් හීනව සිටිති." (රෝම 3:23) අප හැම දෙනාම ශුද්ධවූ දෙවියන් වහන්සේ ඉදිරියේ පව්කාරයෝ වෙති. මුලින් සොරුන් දෙදෙනාම යේසුස් වහන්සේට අපහාස කළෝය. "උන්වහන්සේ සමග කුරුසියෙහි ඇණගසන ලද්දාවූ සොරුන්ද එසේම නින්දා කළෝය" යයි මතෙව් 27:44 හි පවසයි. එක සොරෙක් ඔහුගේ අපහාස නැවැත්තුවේ නැත. "ඔබ ක්‍රිස්තුස් නොවේද? ඔබත් අපත් ගළවාගන්න" යැයි ඔහු කිව්වේය. බොහෝ අය යේසුස් වහන්සේ තුළින් තමන්ගේ කරදරවලට මිදීම ලබා ගැනීමට කැමතිය. එහෙත් තමන්ගේ පව් ගැන අවංක ලෙස පශ්චත්තාපවී, තමන්ගේ හදවතින් දෙවියන් වහන්සේ වෙතට හැරීමට කැමති නැත.

එහෙත් අනෙක් සොරාට පසුව අවබෝදයක් ඇති විය. අනෙක් සොරා ඔහුට තරවටු කරමින් "දඬුවමට පැමිණ සිටින ඔබ දෙවියන් වහන්සේට භය නැද්ද? අප දඬුවම් ලබන්නේ සාධාරණ ලෙසය, අපේ ක්‍රියාවලට සුදුසු විපාකය අපට ලැබී ඇත. නුමුත් උන්වහන්සේ කිසි වරදක් නොකළ සේක" කියා පිළිතුරු දුන්නේය. (මතෙව් 23:40-41) මෙසේ ඔහු තමාගේ පාපය එත්තු ගත්තේය. ඔහු තමාගේ පාපය ගැන අවංක ලෙස පශ්චත්තාප විය. අපද අපගේ පාප එත්තු ගෙන අවංක ලෙස පශ්චත්තාප විය යුතුය. ඔහු යේසුස් වහන්සේ වෙතට හැරී "ස්වාමිනී, ඔබගේ රාජ්‍යයෙන් යුක්තව ඔබ එන කළ මා සිහිකළ මැනව" යි කීවේය. (ශු:ලූක් 23:42) පාපය එත්තු ගත් පසුව අප විසින්ම අපගේ ජීවිත දෙවියන් වහන්සේගේ පාලනයට යටත් කළ යුතුය. එවිට උන්වහන්සේ අපගේ පව් වලට සමාව දී, උන්වහන්සේගේ ආත්මය අප තුළට එවන සේක.

යේසුස් වහන්සේ ඔහුට දුන් පිළිතුර නම් "සැබවක් ඔබට කියමි. අදම ඔබ මා සමග පාරාදීසයෙහි සිටින්නෙහිය" යන්නය. මනුෂ්‍ය ජාතිය කොටස් දෙකකට බෙදී ඇත. එක කොටසක් යේසුස් වහන්සේව ප්‍රතික්ෂේප කර ඇත. අනෙක් කොටස යේසුස් වහන්සේ තමාගේ ගැළවුම්කරු සහ ස්වාමින් වහන්සේ ලෙස පිළිගෙන ඇත. ඔබ අයිති වන්නේ කුමන කොටසටද? ඔබ පළමු කොටසට අයත් නමුත් දෙවෙනි කොටසට අයත් වීමට වඩාත් කැමති නම් පහත සඳහන් යාච්ඤාව ඔබේ මුළු හදවතින්ම උන්වහන්සේට පවසන්න.

ආදරණීය යේසුස් වහන්ස, මම ඔබවහන්සේ ඉදිරියෙහි පව්කරුවෙකු වන බව මම එත්තු ගනිමි. ඔබවහන්සේ මාගේ පව් වෙනුවෙන් ජීවිතය පූජාකල බවත්, මළවුන්ගෙන් නැගිටි බවත්, මම විශ්වාස කරමි. මම මාගේ පව් ගැන අවංක ලෙස පශ්චත්තාප වෙමි. ඔබවහන්සේව මාගේ පෞද්ගලික ගැළවුම්කරු සහ ස්වාමීන් වහන්සේ ලෙස මා පිලිගනිමි. ඔබවහන්සේට මාගේ ජීවිතය බාර දෙමි. මාගේ පව් වලට සමාවුව මැනව. ඔබවහන්සේගේ ආත්මය මා තුළට අවුත් සදාකාලයටම මා තුළ වාසයකළ මැනව. ආමෙන්.

සහෝදර රුවින්ද්‍ර පෙරේරා



# උත්තරීතර තැනැන්වහන්සේගේ කටුක ජීවිත මඟ

මීට වසර දෙදහස් විසිතුනකට පමණ පෙරාතුව ඒ උත්තරීතර තැනැත්තා මෙලොව පහළ වුයේය. එතුමා පහළ වූ ඒ කුරිරු කාලවකවානුව වූ කලී නොදහම, අවනීතිය, අසත්‍ය සත්‍ය කොටගෙන, රාජ්‍ය පාලනය කෙරුණු යුගයක් විය. පූජක පෙළද ආගමේ නාමයෙන් ජනයා පෙළූහ.

උන්වහන්සේ මෙලොව පහළ වුයේ පාලකයන් සහ පූජකයන් විසින් වපුරන ලද එම අවිද්‍යාන්ධකාරයෙන් ජනයා ගලවා ගන්නා පිණිසය. මේ වනාහි මෙම උත්තරීතර තැනැන්වහන්සේ පිළිබඳ කතාන්දරයයි. මෙකී පූජනීය කතාන්දරය ඇරඹෙන්නේ රෝම අධිරාජ්‍යයේ පලස්තීන දේශයේ උන්වහන්සේගේ මව්පියන් විසූ නාසරෙත් ග්‍රාමයෙනි.

රෝම අධිරාජ්‍යයේ පලස්තීන දේශයේ නාසරෙත් නම් ග්‍රාමයෙහි යෝසෙප් සහ මරියා නමින් තරුණයෙක් සහ තරුණියක් විය. මරියා දෙවියන් වහන්සේ ඉදිරියෙහි ශුද්ධව යහපත් කන්‍යාවක ලෙස ජීවත් වූවාය. මේ අතර යෝසෙප් ඇයට ආලය වී, ඇය සමඟ විවාහ වීමට ගිවිසුම් ගෙන තිබුණි. මෙම කාලය අතරතුර ඔවුහු ශුද්ධවන්තව කල්ගෙවමින් ජීවත්වන විට ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආශිර්වාදයෙන් ඇය ගැබ් ගත්තාය.

ඔවුන්ට නාසරෙත් අත්හැර බෙත්ලෙහෙම් පුරයට යන්නට සිදු වන්නේ රාජ නියෝග අනුව දාවිත්ගේ රාජ වංශයට අයත් වුවන්ට උරුම බෙත්ලෙහෙම නිසාය. ඔවුන්ට නාසරෙත් හි වසන්නට අයිතියක් නැත. දරු ගැබක්ද දරාගෙන සිටි මරියා යෝසෙප් සමඟ ගමන් ඇරඹීමට මහ මගට බැස්සාය. කිසිවෙකුගේ හෝ පිළිසරණක්ද නොමැතිව ගමන් කරමින් සිටින ලද ඇයට බොහෝ සේ ගමන් විඩාවට හා වෙහෙසට පත්ව සිටින්නට ඇත. ඔවුහු ගෙයින් ගෙට ගොස් එදින රැය ගත කරන්නට නවාතැන්පලක් සොයාමින් නවාතැන්කරුවන්ගෙන් අවසර ඉල්ලා සිටියහ. එහෙත් කිසිවෙකු හෝ ඔවුනට ඉඩ ලබා දුන්නේ නැත. අවසානයේදී එක් නවාතැන්කරුවෙක් එදින රැය ගත කරන්නට ඔවුනට සිය ගව මඩුවේ ඉඩකඩ සලසා දුන්නේය.


සීතල මැදියම් රාත්‍රියේ යේසු බිළිඳා ගව මඩුවේ දී මෙලොව එළිය ලැබුවේය. එසැනින්ම අහසේ අමුතු තාරකාවක් දිලිසෙන්නට පටන් ගැණින.

මේ අතරතුර ඔටුවන් පිට නැගී කාන්තාරයෙහි ගමන් කරමින් සිටි ශාස්ත්‍රවන්තයන් ඒ තරුව හැඳින ගත්හ. එයින් විශ්වයේ ගැලවුම්කාරයාණන් මෙලොව පහළ වූ බව ප්‍රත්‍යක්ෂ කරගත් ඔවුන් සිය ගමන නවතා එම තාරකාව ඔස්සේ යේසු බිළිඳා සොයා ගොස් එතුමන්ට වැඳ නමස්කාර කළහ.

මෙකල බෙත්ලෙහෙම පාලනය කරමින් සිටි හෙරෝද් රජ එම තාරකාව පිළිබඳ තතු දැනගැනීමෙන් මහත් සේ තැති ගත්තේය. ඊට හේතුව නම් යුදෙව්වන්ගේ රජු මෙලොව පහළ වූ බව එම තාරකාවෙන් කියවෙන බව දැනගත් නිසාවෙනි. කෙසේ වුවද අවසානයේදී එම යුදෙව් බිළිඳා හඳුනාගත නොහැකි වූ නිසාම බෙත්ලෙහෙම් පුරවරයේ සියළු බිළිඳුන් සමූහ ඝාතනය කරන මෙන් ඔහු අණ දුන්නේය. මෙම ආරංචිය සැලවූ වහාම යේසු බිළිඳා රැගත් මා පියන් මිසරයට පලා ගියහ.

එතැන් පටන් අවස්ථා කිහිපයක් හැරෙන්නට තිස් වසරකට ආසන්න කාලයක් එතුමා අප්‍රසිද්ධව ජීවත් විය. අනතුරුව ඔහු සමාජගත වන්නේ යේසු ස්වාමි දරුවන් ලෙස විප්ලවීය දහමක් දේශනා කරමිනි. ශ්‍රාවකයන් දොළොස් දෙනෙකු සමඟ ගමින් ගමට යමින් අයුක්තියට, අසාධාරණයට, අධර්මයට එරෙහිව එතුමන් කරන ලද දේශනා නිසා පූජකවරුන්ගේ නාමයෙන් පෙනී සිටි දුර්ජනයෝද, අසාධාරණයට බදු අය කරමින් ජනයා පෙළන පාලකයෝද කිපෙන්නට විය. අවසානයේදී ඔවුන් විසින් අමූලික අසත්‍ය චෝදනා එල්ල කරමින් යේසු තුමන්ව අත් අඩංගුවට ගත්තා පමණක් නොව, එතුමන්ට එරෙහිව ජනතාවද පෙළගස්වන්නට විය.

යේසු තුමන් පිලාත්ගේ අධිකරණය වෙත කැඳවනු ලැබීය. යේසු තුමන් නිවැරදි බව දැන දැනම මහජන උද්ඝෝෂණ සහ කූට පූජකවරුන්ගේ බලපෑම මැද පිලාත්ට සිදුවන්නේ ඔහු කුරුසියට තබා ඇණ ගසන ලෙස තීන්දු කිරීමටය. ඒ අනුව කසයෙන් තලා, කටු ඔටුණු පැළඳ තමන් ඇණ ගැසීමට නියමිත බව දැන දැනම, කුරුසිය තම කර මතින්ම ඔසවාගෙන කල්වාරි කන්දට ගෙන ගිය යේසු තුමන් කුරුසියට තබා ඇණ ගසා මරා දැම්ණ. එහෙත් තෙදිනකින් උන්වහන්සේ මරණයෙන් උත්ථාන වී ජනයා ඉදිරියේ දර්ශණය විය. ආමෙන්



සූර ලොව්නෙ බැස මෙදිනේ
මවූ කුසිනේ බිහි වෙමිනේ
තුඹු දෙතනේ කිරි බොමිනේ
මිනි ලෙසිනේ වැඩුණු තැනේ

සූර ලොව්නෙ බැස මෙදිනේ
මවූ කුසිනේ බිහි වෙමිනේ
තුඹු දෙතනේ කිරි බොමිනේ
මිනි ලෙසිනේ වැඩුණු තැනේ

සහෝදර එස්. සුමති කරුණාසේන
ක්‍රිස්තියානි රෙපරමාදු දේවස්ථානය - කහටගස්දිගිලිය







කොරියානු කණ්ඩායම හා එක්ව
හැටන් හා කල්පිටිය යන දේවස්ථාන වල පැවැත් වූ නිවාඩු කාලීන බයිබල් පාසැල්





බම්බලපිටිය දේවස්ථානය හා ලින්ඩ්සේ බාලිකා විද්‍යාලය
ඒකාබද්ධව පැවැත් වූ නත්තල් බැති ගී දේව මෙහෙය






දෙහිවල දේවස්ථානය හා ප්‍රෙස්බිටීරියානු විද්‍යාලය
ඒකාබද්දව පැවැත් වූ නත්තල් බැති ගී දේව මෙහෙය



ඔක්තෝබර් මස 22 වන දින දෙහිවල දේවස්ථානයේ දී පැවැත් වූ
එක්සත් නිවාඩු කාලීන බයිබල් පාසැල










ක්‍රිස්තියානි රෙපරමාදු දේවස්ථානයේ
380 වෙනි සාංවත්සරිකය නිමිත්තෙන්
වැල්ලවත්ත හා ගාල්ල
දේවස්ථානයන් හී පැවැත් වූ
එක්සත් දේව මෙහෙයන්



වත්තල දේවස්ථානය ප්‍රතිසංස්කරණය කොට නැවත කැප කිරීම









වුල්වන්දාල් බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමියගේ සමුගැනීමේ
උත්සවයට සහභාගී වූ ගරු සභාපාලක අමල් ඇල්පිටිය ඇතුළු පිරිස

ආදුරුප්වීදිය සිංහල සභාවට වසර 30 ක් සම්පූර්ණවීම නිමිත්තෙන්
පවත්වන ලද ස්තුති කිරීමේ දේව මෙහෙය



ආදුරුප්පුවීදිය දේවස්ථානයේ සහෝදර නිරංජන් ඉමැනුයෙල් මෝසස්
ඩීකන්වරයෙකු ලෙස ආලේප ලැබූ දින



රුවන්ති නිර්මලී හා නිසල් සංකල්ප යන අයගේ පුත්
සියොන් අද්‍රියෙල් ගාල්ල දේවස්ථානයේදී
ගරු ක්ලෙමන්ට් යෝගරාජා සභාපාලක තුමන් විසින්
2022 - 09 - 04 වන දින කැප කිරීම


**කොළඹ 06, ගාලු පාරේ, නො.363 හි පිහිටි ක්‍රිස්තියානි රෙපරමාදු සභාව වෙනුවෙන් චමින්ද රත්නායක සභාපාලකතුමා විසින් සංස්කරණය කර,
නො.119, ගංගොඩවිල, නුගේගොඩ, ඉම්ප්‍රේෂන්ස් මුද්‍රණාලයේ මුද්‍රණය කර, ක්‍රිස්තියානි රෙපරමාදු සභාව කොළඹදී ප්‍රසිද්ධ කරන ලදී.**